# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1893/32 - 2014 දෙසැම්බර් මස 17 වැනි බදාදා - 2014.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාත් සභාවේ 2014 වර්ෂයේ අංක 03 දරන පරිපූරක විධිවිධාන ප්‍රඥප්තිය

2014 මුදල් වර්ෂයේ වියදම් සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013 දෙසැම්බර් මස 21 වෙනි දින අනුමත කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන වෙනුවෙන් පරිපූරක විධිවිධාන යනුවෙන් අංක 01 උපලේඛනයේ දැක්වෙන සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත් පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධවූ හෝ ඒවාට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් පිණිස වූ ප්‍රඥප්තියකි.

උතුරු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

01. මේ ප්‍රඥප්තිය 2014 අංක 03 දරන විසර්ජන (පරිපූරක විධිවිධාන) මුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2014 මුදල් වර්ෂය සඳහා පරිපූරක ප්‍රතිපාදන

02. යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ යම් කිසි නීතියකට හානියක් නොමැතිව මේ ප්‍රඥප්තියෙහි 2014 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන සහ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන 2014 මුදල් වර්ෂය වෙනුවෙන් 2013 දෙසැම්බර් 21 වෙනි දිනයෙහි ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වලට අතිරේකව පරිපූරක විධිවිධාන යනුවෙන් මෙම ප්‍රඥප්තියේ අංක 01 උපලේඛනයේ විධිවිධාන අනුව සීමාවන් ඉක්මවා රුපියල් එක් බිලියන හත්සිය විසිපස් මිලියන හය ලක්ෂ තුන්දහස් පන්සිය විසිදෙකයි (1,725,603,522.00) වන උතුරු පළාත් සභාවේ වියදම්

(අ) පළාත් සභා අරමුදලින් හෝ වෙනත් යම් මුදල් වලින් හා

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආර්) වන වගන්තිය අනුව වෙන් කරන ලද අරමුදල් වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ප්‍රදානය කරන ලද හෝ වෙන් කරන ලද අරමුදල් වලින් පියවිය යුතුයි.

03. 2013 දෙසැම්බර් මස 21 වන දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් උපරිම සහ අවම සීමාවන් මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් ඕනෑම ක්‍රියාකාරකමක 2014 මූල්‍ය වර්ෂයේ අවසානයේ නොපිය වූ හර ශේෂයට සංශෝධනය කරන ලදී.

ඒ. සිවබාලසුන්දරන්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

සි. වී. කන්දයියා සිවඥානම්,
සභාපති,
උතුරු පළාත් සභාව.

01 - 122

1A - PG 2293 — 25 (2014/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*